## 3. මිල සහ උද්ධමනය

*පොදු මිල මට්ටමේ වැඩිවීම හෙවත් උද්ධමනය, 1998 වසරේ අග භාගයේ සිට පහත වැටෙන නැඹුරුවක් දක්විය. එහෙත් ජාත්‍යන්තර වෙළෙඳපොළ මිල ගණන් ඉහළ යාමට ප්‍රතිචාර වශයෙන්, පරිපාලිත මිල ගණන් සංශෝධනය කිරීමේ හේතුවෙන් 2000 වසරෙහි මැයි මාසයෙන් පසු මේ තත්ත්වය වෙනස් විය. එනමුදු වාර්ෂික උද්ධමන වේගය සාමාන්‍ය මට්ටමක පැවතිනි.*

- ▲ කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වැඩිවීම පදනම් කරගෙන මණිනු ලබන වාර්ෂික සාමාන්‍ය උද්ධමන වේගය 1999 පැවති සියයට 4.7 ට සාපේක්ෂව 2000 දී සියයට 6.2 ක් විය.
- ▲ විකල්ප උද්ධමන දර්ශකයක් වන දළ දේශීය නිෂ්පාදිත අවධමනකයට අනුව උද්ධමන වේගය 1999 පැවති සියයට 4.4 ට සාපේක්ෂව 2000 වර්ෂයේදී සියයට 6.7 ක් වූ අතර එය කොළඹ පාරිභෝගික මිල දර්ශකය විසින් දක්වන ලද නැඹුරුව සමග සමගාමී විය.
- ▲ තෙල් සහ තිරිඟු පිටි ආනයන මිල ගණන් ඉහළ යාම සහ රුපියල අවප්‍රමාණය වීම, රාජ්‍ය අයවැය හිඟයට දරිය නොහැකි බලපෑමක් ඇති කළේය. මේ නිසා ආර්ථිකයට වැඩි අහිතකර බලපෑමක් ඇති නොවන අයුරින් සහනාධාර සහිතව පවත්වාගෙන ගිය පරිපාලිත මිල ගණන් තවදුරටත් ඉදිරියට ගෙන යාමට නොහැකි විය.
- ▲ ඒ අනුව ඩීසල්, භූමිතෙල්, තිරිඟුපිටි, පාන්, ගෑස්, විදුලිය, බස් ගාස්තු ඇතුළු තවත් භාණ්ඩ කීපයක මිල ගණන් ඉහළ දැමීමට සිදුවිය. මෙම මිල සංශෝධන, අනිකුත් පාරිභෝගික සහ පාරිභෝගික නොවන ද්‍රව්‍යවල වෙළඳපොළ මිල ඉහළයාමටද හේතුවිය.
- ▲ කෙසේ වෙතත් දේශීය සැපයුම ඉහල මට්ටමකට පත්වීම, මිළ වැඩිවීම් යම් තරමකට සමනය කිරීමට හේතු විය. වසර තුලදී කෘෂිකාර්මික භාණ්ඩ කීපයකම නිශ්පාදනය ඉහල ගියේය. එසේම දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සමස්ත ඉල්ලුම මගින් උද්ධමනයට ඇති කළහැකි බලපෑම වැළැක්වීමට උපකාරි විය.
- ▲ පරිපාලිත මිල ගණන් කීපවරක්ම ඉහළ දැමීමට සිදුවුවද, නිවැරදි මූල්‍ය හා අයවැය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුලින් 2001 වර්ෂයේදී උද්ධමන වේගය සියයට 10ට අඩු මට්ටමකට පත්වේ යැයි අපේක්ෂා කෙරේ.

*උද්ධමන අනුපාතිකය*




*3.1 රූප සටහන*